**දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ - 2021**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත නමුත් වැඩ අවසන් නොකළ කර්මාන්ත ව්‍යාපෘති 18 ක එකතු වටිනාකම රු.25,454,000 ක් ණය හිමියෝ බැර කර කෙරීගෙන යන වැඩ ලෙස හර කරනු වෙනුවට ජංගම වත්කම්හි වෙනත් ලැබිය යුතු දෑ ලෙස හර කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | 2022 ජනවාරි 04 දිනැති හා අංක LGD/10A/න.ගි./2021 දරන පළාත් පාලන කොමසාරිස් වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ගණනය කිරීමේදී රු.5,000 ට වඩා අඩු ප්‍රත්‍යාගණනය/ ගත් මිල ඇති ලී බඩු හා උපකරණ දේපළ, පිරියත හා උපකරණවලින් ඉවත්කර, භාණ්ඩ වට්ටෝරු පොත්වල ඇතුලත්කර වාර්ෂික සමීක්ෂණවලට ඇතුලත් කළයුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ එකතු වටිනාකම රු.500,498 ක් වූ එවැනි අයිතම 214 ක් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගතකර තිබුණි. | | |
| (ඇ) | වටිනාකම රු.5,000 ට අඩු තොග අයිතම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂ සඳහා ක්ෂය වෙන් කිරීම් ලෙස රු.117,233 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | ණය හිමි වෙන්කරන ලද එකතු වටිනාකම රු.2,420,385 ක් වූ ගණුදෙනු හා සිදුවීම් 08 ක් සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂයන්ට ගැලපීමකින් තොරව වත්කම් හා වගකීම් ප්‍රකාශයේ වෙනත් ලැබියයුතු දෑ ලෙස පෙන්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගතවී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ණය හිමි ලෙස වෙන් කළ ප්‍රාග්ධන වත්කම මිලදී ගැනීම් 8 කට අදාල එකතු වටිනාකම රු.954,079 ක් ජංගම නොවන වත්කම් යටතේ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ජංගම වත්කම්හි වෙනත් ලැබිය යුතු දෑ ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2022 ජනවාරි 04 දිනැති හා අංක LGD/10A/න.ගි./2021 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සියළුම සංචිත හා වෙන්කිරීම් සඳහා එහි ඇති ආකෘති අනුව තොරතුරු ඇතුළත් වාර්තාවක් ගිණුමට ඇතුළත් කළයුතු බව සඳහන්ව තිබුණද, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ පිරියත හා උපකරණ කාණ්ඩ 7 ක ක්ෂය වෙන් කිරීමේ ගිණුම්වල ශේෂය රු.162,451 කින් වැඩියෙන්ද, දේපළ පිරියත හා උපකරණ 2 ක ක්ෂය වෙන් කිරීමේ ගිණුම්වල ශේෂය රු.56,286 කින් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 4 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය රු.328,755,376 ක් හා උපලේඛනවල දැක්වෙන ශේෂය රු.271,064,232 ක් වූයෙන් රු.57,691,144 ක නොසැසඳීම් නිරීක්ෂණය විය | මෙම ගිණුම් විෂයන් 04 වෙනස්කම් 2021 වර්ෂයට පෙර සිට පැවත එන වෙනස්කම් වේ. අදාල විෂය නිලධාරීන්ට පවරා මේ පිලිබඳව සොයා බලා කටයුතු කරගෙන යන ලබන බව දන්වා සිටිමි. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් ශේෂයන් 06 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 17,981,571 | උපලේඛන | මෙම ගිණුම් ශේෂයන් 6 ක්, 2015 වර්ෂයට පෙර සිට අවසන් ගිණුමේ පැවත එන ශේෂයන් වන අතර සොයා බලා නිරවුල් කිරීමට තොරතුරු ලබාදෙන ලෙස විෂය භාර නිලධාරීන්ට දන්වා කටයුතු කරගෙන යනු ලබන බව මෙයින් දන්වා සිටිමි. | වෙනස්කම් හඳුනාගෙන උපලේඛන පිලියෙල කිරීමටත් නිරවුල් කලයුතු ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**-------------------**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 371 | 2008 සහ 2009 වර්ෂයන්හිදී ආයතන හා පුද්ගලයින් 13 ක් වෙත ද්‍රව්‍ය, යන්ත්‍ර හා ඉන්ධන ලබාගැනීම සඳහා ලබාදුන් රු.2,070,429 ක්, 2020 වර්ෂයේදී පළාත් පාලන ආයතන 2 කට පොල් සහ සහල් සහනාධාර ලබාදීම සඳහා බාහිර පුද්ගලයෙකුට ලබාදුන් රු.844,250 ක් සහ 2013 වර්ෂයේදී ඉන්ධන ලබාගැනීම සඳහා සමූපකාර සමිතියකට ලබාදුන් රු.66,000 ක් ලෙස අත්තිකාරම් එකතුව රු.2,980,679 ක් 2022 ජූනි 10 දින වන තුරුත් පියවා නොතිබුණි. | 2007 වර්ෂයේ සිට නොපිය වූ අත්තිකාරම් සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් පැවැත්වීම නිර්දේශ කර පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. රු.844,250 අත්තිකාරම් මුදල් ගෙවන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ගම්පහ, මහර පානදුර ලේකම්වරුන්ට දන්වා යවා ඇත. | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව නොපියවන ලද අත්තිකාරම් මුදල් අය කර ගත යුතුය. |
| (ආ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන පනතේ වගන්ති අංක 20 | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා සිදුකරවා ගතයුතු වුවද ප්‍රාදේශීය සභාව විසින් දිවුලපිටිය සතිපොළ භූමිය කඩ කාමර සම්බන්ධව වරිපනම් බදු තක්සේරුව අවසන් වරට සිදුකර තිබුණේ 2014 වර්ෂයේදීය. | දිවුලපිටිය සතිපොල කඩකාමර නව කඩකුලී තක්සේරුව ලබා ගැනීම සඳහා 2022/05/25 දිනැති ලිපියේ තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. එම ලිපියේ පිටපතක් අමුණා ඇත. | සිහිකැඳවීම් යවා නොපමාව තක්සේරුව කරවා නව වරිපනම් බදු රේටයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය . |

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1. **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,140,000 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.72,591,000 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

----------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (අ) | 2021 ඔක්තෝබර් 31 දිනට රු.3,732,641 ක වරිපනම් හිඟ ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි ශේෂය රු.9,403 ක්, වර්ෂ 5 ත් 10 ත් අතර රු.16,220 ක්, වර්ෂ 3 ත් 5 අතර රු.23,832 ක්, වර්ෂ 1 ත් 3 ත් අතර රු.1,783,070 ක් හා වර්ෂ 01 ට අඩු රු.1,900,116 ක් විය. තාවකාලික තක්සේරුව මත වරිපනම් ගෙවීම බදුකරුවන් විසින් ප්‍රතික්ෂේප කිරීම වසර 1 ත් 3 ත් අතර හිගයට හේතු වී තිබුණි. | විශේෂ දේපළ තාවකාලික තක්සේරුව අනුව වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ හෙයින් අදාළ දේපළ හිමියන් කැඳවා සාච්කඡා කරන ලද සාකච්ඡාව අනුව සහ සභා තීරණය පරිදි හිග වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව දන්වා සිටිමි. | දේපල සඳහා නව ස්ථිර තක්සේරු ලබාගෙන ඒ අනුව හිග වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2007 පෙබරවාරි 09 දිනැති අංක 1484 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණි. ප්‍රාදේශීය සභාව විසින් සිදුකරන ලද දේපළ සමීක්ෂණය අනුව මුළු දේපළ සංඛ්‍යාව 57,872ක් ලෙස හඳුනාගෙන තිබුණද, 2021 වර්ෂය වන විටත් සභාව විසින් වරිපනම් අයකර තිබුණේ නේවාසික දේපළ 1116 කින්, ව්‍යාපාරික දේපල 1,573 කින් සහ වෙනත් දේපළ 128 ක් වශයෙන් මුළු දේපළ 2,817 කින් පමණි. 2021 අප්‍රේල් මස තොරතුරු ලබා ගන්නා ලද දේපළ 17,545 ක් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට භාර දී ඇතත්, 2022 මාර්තු 30 වන විටත් නව තක්සේරු ලබා දී නොතිබුණි. | නව තක්සේරු කටයුතු මේ වන විට ආරම්භ කර උපකාර්යාල මට්ටමින් කරගෙන යනු ලබන බව දන්වමි. | දේපල සඳහා නව ස්ථිර තක්සේරු ලබාගෙන ඒ අනුව සියළු දේපලවලින් වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1. **මානව සම්පත් කළමනාකරණය**

සේවක ණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු යාම, මිය යාම, විශ්‍රාම යාම, සේවය අතහැර යාම මත සේවකයින් 40 දෙනෙකුගෙන් රු.693,095 ක් අයවීම් හිඟ හිටව පැවතුණි. | රු.361,275 ක් වූ ශේෂයෙන් රු.196,634 ක ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමටත් ඉතිරි ශේෂ කපාහැරීමටත් කටයුතු සිදුකරමින් පවතින අතර අය නොවී පවතින සේවක ණය සඳහා පෞද්ගලික ලිපිනයන් සොයාගැනිම, ස්ථාන මාරු වී ගිය ස්ථාන පිළිබඳ සොයාගැනිම කටයුතු සිදුකරමින් පවතී. | සේවක ණය අයකර ගැනීමටත්, කපා හැරීමට තීරණය කර ඇති ණය ශේෂය විධිමත් අනුමැතිය සහිතව කපා හැරීමටත් කටයුතු කළ යුතුය. |

3.2. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිවුලපිටිය පොදු වෙළඳපොළ කඩ කාමර 20 ක් සඳහා 2021 දෙසැම්බර් මස රජයේ තක්සේරුකරු විසින් කරන ලද තක්සේරුවේ වාර්තාව නොලැබීම මත, 2014 වර්ෂයේ තක්සේරුව මත කුලී අයකරමින් පැවති බවත්, වල්පිට තුරුසෙවන කඩ කාමර 38 හි අවසන් වරට තක්සේරුව 2008 වර්ෂයේදී සිදුකර තිබීම හේතුවෙන් කඩ කාමරයක මාසික කුලී මුදල රු.400 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණ බවත් නිරීක්ෂණය විය. ඉදිරි තක්සේරුව සඳහා පිඹුරුපත් පිළියෙල කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් මත එම කටයුත්ත සඳහා 2021 නොවැම්බර් 25 දින සභා අනුමැතිය ලැබී තිබුණද 2022 ජුනි 10 වන තුරුත් පිඹුරුපත් සකස්කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි | නව කඩ කුලී තක්සේරුව ලබාදෙන ලෙස 2022 මැයි 26 ලිපියෙන්ද දන්වා යවා ඇත. තක්සේරු වාර්තාව ලැබුන පසු නව කඩ කුලී අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | රජයේ තක්සේරුකරු විසින් කරන ලද තක්සේරුවේ වාර්තාව ලබා ගැනීමත්, ඉදිරි තක්සේරු ප්‍රතිශෝධනය සඳහා පිඹුරුපත් පිළියෙල කිරීමත්, සිදුකර නව තක්සේරු මත කුලී අයකරගැනීමට කටයුතු කළයුතුය. |

3.3. **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වල්පිට තුරු සෙවණ භූමියෙහි රු.1,846,590 ක සහා වියදමින් ඉදිකරන ලද හෙළ බොජුන්හල 2019 දෙසැම්බර් 18 දින වන විට අවසන්කර තිබුනද ව්‍යාපෘති වාර්තාව මහා සභාවට ඉදිරිපත්කර සම්මත කර තිබුණේ 2021 සැප්තැම්බර් 30 දිනය. බදු ගැනුම්කරුවන් පිළිබඳව නිවැරදි අධ්‍යයනයකින් තොරව මෙම ඉදිකිරීම සිදුකර තිබීම හේතුවෙන් ගොඩනැගිල්ල 2021 ජූනි 10 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘති වාර්තාව 2022 අප්‍රේල් 08 දින මහා සභාවට ඉදිරිපත් කර ටෙන්ඩර් කර බදු දීමට පුවත්පත් දැන්වීමක් පලකර ඇත. | ඉල්ලුම පිළිබඳව නිවැරදි අධ්‍යයනයකින් පසුව ඉදිකිරීම සිදුකිරීමටත්, නව තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් කිරීමටත් කටයුතු කළයුතුය. |

3.4. **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **පවරා නොගත් වත්කම්** | | |
| ප්‍රාදේශීය සභාවට ලද දිනය විගණනයට ඉදිරිපත් නොකරන ලද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ලද වාහන 03 ක් සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද වාහන 03 ක් ඇතුළුව එකතු වටිනාකම රු.31,879,173 ක් වූ වාහන 06 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. | වාහන පවරාගැනීමට කටයුතු කළයුතු වේ. |

3.5. **පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් රැස් කරන ලද කසළ, කසළ මධ්‍යස්ථානයට රැගෙන යාමට පෙර ගබඩා කිරිමට නිශ්චිත ස්ථානයක් සකස්කර දී නොතිබීම හේතුවෙන් පරිසර දූෂණයක් සිදුව තිබුණු බව නිරීක්ෂණය වූ අතර, කසළ ගබඩා කිරීම සඳහා සුදුසු ස්ථානයක් සකස්කිරීම සඳහා වන රු.680,000 ක ඇස්තමේන්තුවක් 2022 පෙබරවාරි 18 කාර්මික කමිටුවේදී තීරණය වී ඇතත් 2022 ජුනි 10 වන තුරුත් එම කොන්ත්‍රාත්තුව ලබාදීමට කටයුතුකර නොතිබුණි. | කසළ ගබඩාකර තැබීමට සුදුසු ස්ථානයක් සකස්කිරීම සඳහා 2022 පෙබරවාරි 18 දිනැති කාර්මික කමිටුවේ අංක 01.09 යටතේ තීරණය වී ඇත | කසළ එකතු කිරීමේදී දිරන සහ නොදිරන වශයෙන් වෙන් කරන ලද කසල පමණක් එකතු කිරීමටත් එසේ එකතු කර ගන්නා ලද වෙන් කළ කසල ඍජුවම කෙරවලපිටිය කසළ මධ්‍යස්ථානයට රැගෙන යාමටත් කටයුතු කළ යුතුය. |